# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1954/5 - 2016 පෙබරවාරි මස 15 වැනි සඳුදා - 2016.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ඉමදූව ජල සම්පාදන ක්‍රමය යටතේ වතවන ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ජනවාරි මස 28 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/2/1176

**උපලේඛනය**

මාතර දිස්ත්‍රික්කයේ, ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 175A, මාවැල්ල ග්‍රාම නිලධාරි වසමේ, මාවැල්ල - හව්පේ ගමේ පිහිටි තැන්නහේනවත්ත නොහොත් කෝන්ගස්හේනවත්ත නැමති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු විමලසිරි නිශ්ශංක මහතා විසින් පිළියෙල කරන ලද අංක 2437 දරන පිඹුරේ කැබලි අංක 2A ලෙස පෙන්නුම් කෙරෙන සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0253 (පර්චස් 10) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පැඟිරිහේන හන්දියේ සිට ගල්ගොඩේ හන්දිය දක්වා වූ මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ කැබලි අංක 2 හි ඉතිරි කොටස ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ කැබලි අංක 2 හි ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ කැබලි අංක 2 හි ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : ඩැනී විතානවසම් මයා,<br>
වෙදගෙදර - වතවන<br>
ඉමදූව.

03 - 11

1A - G 23028 — 16 (2016/02)

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට බදුල්ල නාගරික අප ජල හා මලාපවහන පද්ධතියේ පිරිපහදු ඒකකය ඉදිකිරීම සඳහා මැද ඕතලාව ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ජනවාරි මස 28 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1171

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිඳගොඩ අංක 78K, ග්‍රාම නිළධාරි වසමේ, හංවැල්ල ගමේ පිහිටි ඕතලාව මැද ඕතලාව නැමති ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 02යි, රූඩ් 02 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.
:

*උතුරට* : රඹුක්පොත ඔය ;
*නැගෙනහිරට* : වැලිඅරාවේ පතන මුල්ල ;
*දකුණට* : මේස්ත්‍රියාගේ කුඹුරේ පහළ ;
*බටහිරට* : පල්ලේඕතලාවේ පහළ කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ඩී. ඒ. ඉරෝෂන් තුෂාර මයා,
ඇල්ල කපුහේන,
වලස්ගල,
දික්වැල්ල.

03 - 12

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.